# ගණිතය - 6 ශ්‍රේණිය

## 10 පාඩම තේරීම

අප දන්නා බොහෝ දෑ, හඳුනාගත් පොදු වූ ලක්ෂණ ඇති කාණ්ඩවලට වෙන් කර ගත හැකිය .

නිදසුනක් ලෙස පහත සඳහන් සතුන් සමූහය සලකමු.

ගිරවා , බල්ලා , එළදෙන , කොටියා , කපුටා , මුවා ,මොණරා

ඌරා , සිංහයා

මෙහි දැක්වෙන සතුන් විවිධ ආකාරයට කාණ්ඩවලට වෙන් කල හැකිය. මෙම සතුන් ගමන් කරන ආකාරය සැලකූ විට පහත දැක්වෙන අයුරින් කාණ්ඩ දෙකකට වෙන් කල හැකිය.

| පියාඹන සතුන් | ඇවිදින සතුන් |
|---|---|
| ගිරවා , කපුටා මොනරා | බල්ලා , එළදෙන ,කොටියා, මුවා, ඌරා , |

එම සතුන් ආහාරයට ගන්නා ද්‍රව්‍ය අනුව පහත දැක්වෙන කාණ්ඩ 3 ට වෙන් කල හැකිය.

| ශාක භක්ෂක | මාංශ භක්ෂක | සර්ව භක්ෂක |
|---|---|---|
| එළදෙන, මුවා ගිරවා | කොටියා සිංහයා | බල්ලා , ඌරා මොණරා , කපුටා |

### අභ්‍යාස

1. පහත දී ඇති ආහාර ද්‍රව්‍යවලට පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කර , එක් එක් කාණ්ඩයට අයත් ඒවායේ නම් ලියන්න. ඒ ඒ කාණ්ඩය සඳහා සුදුසු නම බැගින් ලියන්න .

   වීසා , තේ , පාන් , කිරි , කෙසෙල් , කේක් , පලුඩා , බිස්කට් , කෝපි , බත් , අයිස් ක්‍රීම් ,

   බටර් , පලතුරු බීම , චොක්ලට් , වතුර

2. පහත දී ඇති රටවල් වල නම් සුදුසු පරිදි කාණ්ඩ දෙකකට වෙන් කර ලියා , ඒ ඒ කාණ්ඩ සඳහා සුදුසු නම බැගින් ලියන්න .

   ප්‍රංශය , එක්සත් රාජධානිය , චීනය , ඉන්දියාව , ස්පාඤ්ඤය, ඉරානය , ඉතාලිය , ජපානය ,

   ශ්‍රී ලංකාව , පෝලන්තය, ස්වීඩනය, ජර්මනිය , තායිලන්තය.

3. පහත දී ඇති සංඛ්‍යා , සුදුසු පරිදි කාණ්ඩවලට වෙන්කර ලියා එම කාණ්ඩ නම් කරන්න.

$$\frac{3}{7}\ ,\ 25\ ,\ \frac{1}{3}\ ,\ 6\ ,\ \frac{1}{7},\ 13\ ,\ \frac{4}{9}\ ,\ \frac{4}{4}\ ,\ 34\ ,\ \frac{3}{8}\ ,\ \frac{2}{9}\ ,\ \frac{1}{5}$$

4. පහත සඳහන් දේවල් කිසියම් පොදු ලක්ෂණයක් අනුව කාණ්ඩ දෙකකට වර්ග කර ඇත. එම පොදු ලක්ෂණ හඳුනා ගෙන එම කාණ්ඩ සඳහා සුදුසු නම් ලියන්න.

- මහවැලි
- කැළණි
- කළු
- මැණික්

- සමනල
- පිදුරුතලාගල
- රිටිගල
- නකල්ස්

5. පහත සඳහන් ක්‍රීඩා කාණ්ඩ දෙකකට වෙන් කර ඇත . එම පොදු ලක්ෂණය හඳුනාගෙන එම කාණ්ඩ සඳහා සුදුසු නම් යෝජනා කරන්න .

- බැඩ්මින්ටන්
- මේස පන්දු
- කැරම්
- චෙස්

- ක්‍රිකට්
- එල්ලෙ
- ටෙනිස්